දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2013 පරීක්ෂණය - 2016 සැප්තැම්බර්
Bachelor of Arts General (External) Degree Part I 2013 Examination – September 2016

සිංසා 2.1 - සම්භාව්‍ය සිංහල පද්‍ය කාව්‍යය හා ව්‍යාකරණ සම්ප්‍රදාය
SLG 2.1 - Classical Sinhala Poetry and the Grammatical Tradition

කාලය පැය තුන යි

පළමුවන කොටසට හා II, III කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන,
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
(නො පැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.)

---

## I කොටස

01. පහත දැක්වෙන පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

(අ) හමළ නෙලෙ සරා - සරා සිසි සොමි ඉසිළී
සිළී ගිරිරඟනි මියුරු - මියුරු සර ලී හස් කැන්

මොණරඹළ පිල් නිල් - මහනෙල් කැන් බලාවැල
මලිගිය මල්දම් හළ - දසකත් යත් ගන පියා

(කව්සිළුමිණ, ඇම්.බී. ආරියපාල (සංස්) 457, 458 ගී

(ආ) පැහැසරණි ය මිණිපැමිණි ය කොත් අගට
බඳ කිකිණි ය දද ගිහිණි ය විමන් වට
නොවැපැරණි ය වන් රමණි ය විටින් විට
සැළලිහිණි ය වඳු කැලණි ය පුර වරට

තව ර කැරැ කොකුම් සඳනෙන් තුනු සියල
පව ර සුවඳ මල්දම් පැළැඳ මනකල
බැහැ ර සිතු නොලූ හිමින’ඹුවො කෙළි ලොල
එපු ර ඉදිති සඳපානේ සඳලුවල

(සැළලිහිණි සන්දේශය, සුචරිත ගම්ලත්, (සංස්) 52, 57 පද්‍ය

(ඇ) බැඳි දන මන වැයුමෙහි ඇදුරෝ යා
විඳි සත් සර වෙණ නද මදුරෝ යා
රැඳි සතොසින් සැනහුණු ඉඳුරෝ යා
වැදි දන සිරි ගත්තුය කිඳුරෝ යා

සතො ස් කරන වීණා නද ඇසුමට
නොගො ස් සිටින පිල්බර ගණ ගොදුරට
වෙසෙ ස් රුවින් තම මැවුවත් බඹහට
සඳැ ස් සවන් නො කළැයි වූ නොසතුට

(ගුත්තිල කාව්‍යය, ඩබ්.එෆ්. ගුණවර්ධන (සංස්) 241, 243 පද්‍ය

(ඇ) වනත් නොයෙක් ගං හෝ ඇළ කඳුරු පැන
මහත් ගැඹුරු සිඳු නොයනෙව් වෙරළ පැන
ලදත් මෙ මුළු දඹදිව රජ සිරි සුදන
සිරිත් ලෙසට පවතී උඩඟු නොවමින

නඳන ගුණ නුවණ යුතු උතුමෝ මහත
නොගෙන කිසි කරුණු සත සුවපත් කරත
දිළෙන සා මඬුලු යුතු තුරු පෙළ දිමුත
යනෙන සත සතපමින් ගිම් දුර හරිත

(සුභාෂිතය, සුචරිත ගම්ලත් (සංස්) 85, 93 පද්‍ය
(ලකුණු 28 යි)

## II කොටස

02. එක්කෝ,
<u>කව්සිළුමිණි</u> කවියා කුස ජාතක කතාව මහා කාව්‍යයකට උචිත අන්දමින් සකසා ගත් ආකාරය කාව්‍යයේ සාර්ථකත්වයට කෙසේ හේතු වී දැයි සාකච්ඡා කරන්න.

නැතහොත්,
ප්‍රභාවතිය, තම ස්වාමියා වූ කුස රජු අත්හැර සිය රට බලා යාම සාධාරණ දැයි <u>කව්සිළුමිණ</u> මහා කාව්‍යයේ අදාළ නිදසුන් ඇසුරින් විමසන්න.

03. සැළලිහිණි සන්දේශ කතුවරයා සතු වර්ණනා චාතුර්යය ඔබට අභිමත වැණුම් දෙකක් ඇසුරින් පහදා දෙන්න.

04. කවි බසින් විසිතුරු බණක් කීමේ නිසි ගෞරවය, වෑත්තෑවේ හිමියන්ට හිමිවේදැ යි ගුත්තිල කාව්‍යයෙහි වර්ණිත අවස්ථා නිදසුන් කර ගනිමින් පහදන්න.

05. සදුපදේශ, පුද්ගල හා සමාජාභිවර්ධනයට කෙසේ ඉවහල් වේ ද යි සුභාෂිතය ඇසුරින් සනිදර්ශනව සාකච්ඡා කරන්න.

## III කොටස

06. සිංහල අක්ෂර මාලාවේ ප්‍රවර්ධනාත්මක වෙනස්කම් ඇතිවීමට බලපෑ හේතු කවරේදැ යි සිදත් සඟරා හෝඩිය හා නූතන සිංහල හෝඩිය ආශ්‍රයෙන් කරුණු දක්වන්න.

07. "මේ ය මෝ යන වහරට කරුණු වූයේ ලිඟු නම්"
ඉහත දක්වෙන සිදත් සඟරා පාඨය හඳුන්වා, සිංහල භාෂාවේ පුරුෂ මූලික ශබ්දවලින් ස්ත්‍රී ලිංගික ශබ්ද සාදා ගන්නා විධි කවරේදැ යි සනිදර්ශන ව දක්වන්න.

08. “නොදැව් නුගුණ දැව් නිසා සකරුණෙන් දා මුව වැ සිදු කිරිය නම්”
මේ සිදත් සඟරා උධෘතය විග්‍රහ කොට, සිංහල ක්‍රියා පද විෂයයෙහි තෙකල් කිරිය (ත්‍රෛකාලික ක්‍රියා) යනු කවරේ ද යි සනිදර්ශනව හඳුන්වා දෙන්න.

09. පහත දැක්වෙන මාතෘකාවලින් දෙකකට (02) විස්තරාත්මක සටහන් ලියන්න.

i. සන්ධි කාර්ය
ii. කර්ම විභක්ති ප්‍රයෝග
iii. විශේෂණ සමාසය
iv. විධි ක්‍රියා
v. කෘදන්ත

(02 - 09 ප්‍රශ්නවලට ලකුණු 18 බැගිනි)